# 20 වැනි සංශෝධන කෙටුම්පත මැනවින් කියවා අධ්‍යයනය කර අත ඔසවනවාද නැද්ද කියල තීරණය කරන්න

## පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි



**වල්ගම – ආර්.පී. ජයවීර**

තුනෙන් දෙකේ බලයෙන් ගෙනෙන 20 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් රටට අහිතකර නොව රටට යහපත් කියන පණිවුඩය ඒ ආදර්ශය දෙන්නට ආණ්ඩුවට හැකියාව තියෙනවා යැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

මේ මහතා මේ බව පැවැසුවේ පසුගිය මහ මැතිවරණයට පැෆරල් සංවිධානයේ නිරීක්ෂණයට සහභාගි වූ අය සඳහා සහතික පත් බෙදාදීමේ අවස්ථාවෙන් පසු පැවැති මාධ්‍ය හමුවේදී ඒ මහතා එසේ කීය.

රෝහණ මහතා වැඩිදුරටත් මෙසේ පැවසුවේය.

විසිවැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා නිදහස් හා සාධාරණ මැතිවරණයකට බාධා ඇති කරන කරුණු හා සාධක ඇතුළත් වී තිබෙනවා.

ස්වාධීන මැතිවරණ කොමිසම ව්‍යවස්ථාදායක සභාවක් වෙනම පත් කිරීම වෙනුවට මේ ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා පත් කරන තත්ත්වයට යෝජනා වී තිබෙනවා.

රාජ්‍ය බලය හා රාජ්‍ය දේපළ අයථා පරිහරණය වැළැක්වීම සඳහා මැතිවරණ කොමිසමට තිබුණු බලය මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉවත් වී තිබෙනවා.

මැතිවරණ සමයේදී රාජ්‍ය පත්වීම් මාරු කිරීම් වළක්වාලීමට මැතිවරණ කොමිසමේ බලතල වළ ක්වාලීමට කටයුතු කර තිබෙනවා.

මැතිවරණයකදී කැබිනට් මණ්ඩලයට පමණයි ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබුණේ. නමුත් විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයේදී රාජ්‍ය හා නියෝජ්‍ය ඇමැතිවරුන්ටද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ බලය ලැබෙනවා.

එම නිසා සාධාරණ හා නිදහස් මැතිවරණයකට කිසිසේත්ම සාධනීය සාධකයක් හැටියට අපි මේ 20 වැනි ව්‍යවස්ථා සංශෝධන දකින්නේ නෑ.

ආබාධ සහිත අයට ඡන්දය භාවිත කිරීමේදී ගැටලු රාශියක් ඇති වී තියෙනවා. මේවා වෙනස් කරන්නට පැහැදිලි බලයක් දැන් ආණ්ඩුවට ලැබිලා තියෙනවා. මැතිවරණයේදී අපේක්ෂක වියදම් සීමා කිරීම සකස්වෙලා තියෙනවා. ඒවා සම්මත කිරීමේ වගකීම මේ තුනෙන් දෙකේ බහුතරය සහ පාර්ලිමේන්තුවට හැකියාව තිබෙනවා.

ඒ වගේම විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන තවත් බරපතළ කාරණාවක් අපි හඳුනාගෙන තියෙනවා. විශේෂයෙන් විගණන කොමිසම අහෝසි කිරීම, ඒ වගේම රාජ්‍ය සමාගම විගණනය ඉවත් කර තිබීම වැනි කරුණු.

මහජන මුදල් පාර්ලිමේන්තුවට පාලනය කිරීමේ තියෙන අයිතිය නැති නම් මහජන මුදල් අධීක්ෂණය පාර්ලිමේන්තුවට තියෙන අයිතිය මේ සංශෝධනය හරහා පාර්ලිමේන්තුවට අභියෝග වී තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හැකියාව ලැබෙන්නේ කොමිසම හෝ විගණන දෙපාර්තමේන්තුව මේවා විගණනය කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළොත් පමණයි.

ඒ වගේම අපි දන්නව මේ ආණ්ඩුව පැහැදිලි බහුතරයක් ඔවුන්ගේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට, විශේෂයෙන් 19 වැනි ව්‍යවස්ථාව වෙනස් කරන්නට ඔවුන්ගේ මැතිවරණ කාලයේදී ප්‍රධාන ප්‍රකාශයක් බවට පත්වෙලා තිබුණා. ඒ නිසා ඔවුන්ට අපිව අභියෝගයට ලක් කරන බෑ. ඒත් දහනවයේ තිබුණු සංශෝධනය කරන ඕනෑම දෙයක් සම්මත කිරීමේ අයිතිය ඒ හරහා ලැබිලා නෑ.

පාර්ලිමේන්තුවේ සිටින 225ම මන්ත්‍රීවරුන්ට අපි ආයාචනා කර සිටිනවා ආණ්ඩු පක්ෂයේ වුණත් විපක්ෂය වුණත් මේ විසිවැනි සංශෝධන කෙටුම්පත මැනැවින් අධ්‍යයනය කරලා ඔබ 20ට අත ඔසවනවාද නැද්ද කියන එක ඔබ තීන්දු කරන්න.

සහතික පත් බෙදාදීමේ අවස්ථාවට කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් සජිත් වෙල්ගම මහතා, ෆැපරල් සංවිධානයේ සම්පත්දායක තුෂාර රාජපක්ෂ මහතා ඇතුළු මැතිවරණ නිරීක්ෂණයට සහභාගි වූ නිරීක්ෂකයන් පිරිසක්ද මෙම අවස්ථාවට සහභාගි වී සිටියහ.